





වර්ෂ 2017 ක් වූ නොවැම්බර් මස 29 වැනිදා බදාදා

# විද්‍යා

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නිල පුවත්පත

දිනමිණ

dinamina.lk

@dinaminanews

# ජාතික නව නිපැයුම් දිනයේදී විශිෂ්ටයෝ 'දසිස්' සම්මානයෙන් පිදුම් ලබති

ජාතික නව නිපැයුම්කරුවන්ගේ දින සැමරුම් උළෙල විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි. මෙරටින් බිහි වූ අග්‍රගණ්‍ය විද්‍යාඥයකු, නව නිර්මාණ ශිල්පියකු මෙන්ම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රථම කොමසාරිස් ධූරය ද හෙබවූ ඉංජිනේරු ඒ.එන්. එස්. කුලසිංහ මහතාගේ ජන්ම දිනය යෙදෙන්නේ ඔක්තෝබර් මස 26 වැනි දින එතුමන්ට කරන ගෞරවයක් ලෙස එදින මෙරට ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ලෙස ප්‍රකාශයට පත් කර තිබේ.

03 වැනි පිටුවට...




# ජාතික විද්‍යා පා ගමන

## ITI පරිශ්‍රයේ සිට විහාරමහා දේවි උද්‍යානය දක්වා

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් නොවැම්බර් මස 10 –17 දක්වා කාලය "ජාතික විද්‍යා සතිය" ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. "ගෝලීය අවබෝධය සඳහා විද්‍යාව" තේමාව යටතේ ලෝක විද්‍යා දින සැමරුමට සමගාමීව ප්‍රකාශයට පත්කළ විද්‍යා සතිය තුළ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල මෙහෙයවීමෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය ඉලක්ක කරගත් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරිණි.

03 වැනි පිටුවට...





නොවැ : 29/30

GLOBAL RESEARCH COUNCIL

## ගෝලීය පර්යේෂණ කවුන්සිලයේ ආසියා - පැසිපික් කලාපීය රැස්වීම

ගෝලීය පර්යේෂණ කවුන්සිලය (Global Research Council) යනු ලොව පුරා රටවල විද්‍යා හා ඉංජිනේරුමය පර්යේෂණ සඳහා අරමුදල් සපයන ආයතන එකමුතුවෙන් සැදි සංවිධානයක් වේ. ස්ථාපිත මහලේකම් කාර්යාලයකින් තොරව වුව ද එහි කටයුතු මනාව පවත්වාගෙන යනු ලැබේ. ලොව පුරා ඇති විද්‍යාත්මක පර්යේෂණ සඳහා අරමුදල් සපයන ආයතන අතර ඉහළ ගුණාත්මයෙන් යුතු සහයෝගිතාවන් ඇති කිරීම සඳහා දත්ත සහ විශිෂ්ට ක්‍රියාවලියක් සාමූහිකව යොදා ගැනීම හා වර්ධනය උදෙසා මේ සංවිධානයේ...

03 වැනි පිටුවට...

## විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නව නිල වෙබ් අඩවිය ස්ථාපිත කෙරේ



නව තාක්ෂණික පහසුකම් සහිතව, ඉතා කඩිනමින්, අවශ්‍ය ඕනෑම කෙනකුට සම්බන්ධ විය හැකි ලෙස නිර්මාණය කළ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නව වෙබ් අඩවිය (www.mostr.gov.lk) පසුගියදා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් නිල වශයෙන් විවෘත විය.

03 වැනි පිටුවට...

(www.mostr.gov.lk)



# දැයට ජය ගෙනෙන ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගීතාව

ජාතික විද්‍යා පදනම යනු විද්‍යා ක්ෂේත්‍රයෙහි කටයුතු සඳහා අරමුදල් ලබාදෙන මෙරට ඇති ප්‍රධානතම ආයතනය යි. දේශීය විද්‍යාත්මක ප්‍රජාවට, විදේශීය විද්‍යාත්මක ප්‍රජාවන් හා කටයුතු කිරීමට අවස්ථාව උදකර දීම මගින් ජාත්‍යන්තර වශයෙන් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය ද සිදු කෙරේ. එමගින් මෙරට විද්‍යාත්මක ප්‍රජාවට සිය පර්යේෂණ හා ඒ ආශ්‍රිත කටයුතු වැඩිදියුණු කරගැනීමට උපරිම ශක්‍යතාවන් සඳහා ඉඩකඩ සලසා දෙනු ලැබේ. අවබෝධතා ගිවිසුම් ඔස්සේ එවැනි කටයුතුවලට ජාතික විද්‍යා පදනම මගින් පහසුකම් සැලසූ අවස්ථා කිහිපයක් මෙසේ ගෙනහැර දක්වමු.

### ජාතික විද්‍යා පදනම සහ පාකිස්ථානු ජාතික විද්‍යා පදනම අතර අවබෝධතා ගිවිසුම

පාකිස්ථාන අගමැති නවාස් ශරීෆ් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර දී 2016 වසරේ ජනවාරි 05 වැනි දින, ජාතික විද්‍යා පදනම හා පාකිස්ථානු ජාතික විද්‍යා පදනම අතර ද්විපාර්ශ්වික විද්‍යාත්මක සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අස්සන් කරන ලදී. ආයතන දෙකෙහි ම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් එම වසරේ නොවැම්බර් මස 18 වැනි දින මේ යටතේ වූ පළමු ඒකාබද්ධ කමිටු රැස්වීම ශ්‍රී ලංකාවේ දී පැවැත්විණි. එම රැස්වීමේ දී එකඟ වූ පරිදි දෙරටෙහි පර්යේෂකයන් සඳහා සහයෝගීතා පර්යේෂණ සිදු කිරීම උදෙසා ඒකාබද්ධව ව්‍යාපෘති යෝජනා කැඳවීමට 2017 වසරේ පෙබරවාරි මස මැදභාගය වන විට හැකි විය. මෙය ජාතික විද්‍යා පදනමෙහි ඉතිහාසයෙහි මුල් ම ජාත්‍යන්තර ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති යෝජනා කැඳවීම යි. මේ අවබෝධතා ගිවිසුම යටතෙහි දෙවැනි ඒකාබද්ධ කමිටු රැස්වීම 2017 වසරේ සැප්තැම්බර් මස 15 වැනි දින පාකිස්ථානයේ දී පවත්වන ලදී. එහිදී ආයතන දෙකෙහි ම එකඟතාවෙන් ඒකාබද්ධ අරමුදල් සම්පාදනය සඳහා පර්යේෂණ ව්‍යාපෘති 06ක් තෝරාගැනීම සිදු විය. මේ ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනයට අදාළ කටයුතු මෙරට රාජ්‍ය භාණ්ඩාගාරයේ සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සාදර අනුග්‍රහය යටතේ දැනට සිදුකෙරෙමින් පවතියි.

### ජාතික විද්‍යා පදනම සහ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම අතර අවබෝධතා ගිවිසුම

ජාතික විද්‍යා පදනම මගින් අස්සන් කරනු ලැබූ දෙවැනි අවබෝධතා ගිවිසුම අස්සන් කරනු ලැබුවේ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම සමග යි. ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ නිල චීන සංචාරයක් අතරතුර දී පැවැති රාජ්‍ය උත්සවයක දී 2016 වසරේ අප්‍රේල් මස 08 වැනි දින මෙයට අස්සන් තබන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පවත්වන ලද පළමු ඒකාබද්ධ වැඩමුළුව 2017 වසරේ ජූලි මස 04 වැනිදා සිට 07 වැනිදා දක්වා චීනයේ බීජිං නුවර දී පැවැත්විණි. එහි තේමාවන් වූයේ සෞඛ්‍ය, ජලය හා දේශගුණ විපර්යාස ආදිය යි. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු ශ්‍රී ලාංකික විද්‍යාඥයන් 24 දෙනකුගෙන් සැදි කණ්ඩායමක් මේ සඳහා සහභාගී වූහ. ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් ඇරඹීම සඳහා පුළුල් ලෙස සාකච්ඡා පැවැත්වීමට ශ්‍රී ලාංකික හා චීන විද්‍යාඥයන්ට මේ මගින් ඉඩකඩ සැලසුණි. මේ වැඩමුළුව සඳහා පසු විපරමක් වශයෙන්, ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති සඳහා වූ පළමු නිවේදනය ජාතික විද්‍යා පදනම හා චීන ජාතික ස්වභාවික විද්‍යා පදනම මගින් 2017 සැප්තැම්බර් මස 29 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී. මේ යටතේ ඒකාබද්ධ අරමුදල් සම්පාදනය සඳහා සුදුසු පර්යේෂණ යෝජනා දෙරටේ ම විද්‍යාඥයන්ගෙන් ලබාගැනීම , 2017 දෙසැම්බර් මස 29 දින දක්වා දෙපාර්ශ්වය මගින් ම සිදු කෙරේ. මේ පර්යේෂණ යෝජනා සෞඛ්‍යය, ජලය හා පරිසරය යන පුළුල් තේමා ඔස්සේ ලබා ගැනීමට නියමිතය.





### ජාතික විද්‍යා පදනම හා ජපාන විද්‍යා තාක්ෂණ ඒජන්සිය අතර සහයෝගිතා ගිවිසුම

ජාතික විද්‍යා පදනම සහ ජපාන විද්‍යා හා තාක්ෂණ ඒජන්සිය අතර විද්‍යා හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුමක් 2017 වසරේ ඔක්තෝබර් මස දෙවැනි දින කියෝතෝහි දී 'සමාජය උදෙසා විද්‍යාව හා තාක්ෂණය' (Science and Technology for Society) යන ජපාන සංසදය පැවැත්වෙන අතරතුර දී අස්සන් තැබිණි. ජාත්‍යන්තර විද්‍යාත්මක සහයෝගීතාව ශක්තිමත් කිරීමේ අරමුණින් ජාතික විද්‍යා පදනම විසින් 2016 වසරේ සැප්තැම්බර් මස 6 සහ 7 යන දෙදින තුළ දී සංවිධානය කරන ලද "NSF ගෝලීය හවුල" (NSF Global Partnerships) නමැති වැඩසටහන ඔස්සේ මේ සඳහා ආරම්භකත්වයක් සැපයුණි. මේ සහයෝගිතා ගිවිසුම අස්සන් තැබීමේ අවස්ථාවට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු ශ්‍රී ලාංකික නියෝජිත පිරිසක් සහභාගී වූහ.



ඉහත දක්වන ලද ආකාරයට ශ්‍රී ලාංකික විද්‍යාඥයන් සහ ජාත්‍යන්තර විද්‍යාත්මක ප්‍රජාව අතර සබඳතා වැඩිදියුණු කිරීමටත්, එමගින් මෙරට විද්‍යාත්මක කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත් ජාතික විද්‍යා පදනම මගින් ප්‍රයත්නයන් දරනු ලැබේ. එම වත්මන් ප්‍රයත්නයන් හි සශ්‍රීක පල නෙළාගැනීමට ඉදිරි වසරවල දී හැකි වනු නො අනුමාන ය.

**තිළිණාකුමාරි කඳනමුල්ල**
**(විද්‍යාත්මක නිලධාරී,**
**ජාත්‍යන්තර සම්බන්ධතා අංශය,**
**ජාතික විද්‍යා පදනම)**

# සහයෝගිතා ආයතනික පුහුණු වැඩසටහන (CITI)

ඇමෙරිකා එක්සත් ජනපදයේ මයාමි විශ්වවිද්‍යාලය මගින් නිර්මිත සහයෝගිතා ආයතනික පුහුණු වැඩසටහන (Collaborative Institutional Training Initiative) ජාතික විද්‍යා පදනම මගින් ශ්‍රී ලාංකික පර්යේෂකයන් සහ ආචාරධර්ම සමාලෝචන කමිටු සාමාජිකයන් සඳහා හඳුන්වා දී ඇත.

CITI වැඩසටහන යනු ලොව පුරා පර්යේෂකයන් මිලියන 10කට අධික සංඛ්‍යාවක් පුහුණු කළ අධ්‍යාපනික වැඩසටහනකි. සහයෝගීතා ආයතනික පුහුණු වැඩසටහන මගින් වෙබ් අඩවි පදනම් කරගත් පර්යේෂණ අනුකූලතාව සහ ආචාරධර්ම පිළිබඳ වූ විවිධ ක්ෂේත්‍රවල පුහුණුව සපයයි. CITI වැඩසටහන මගින් පහත සඳහන් මාතෘකා යටතේ පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසා තිබේ.

- සත්ත්ව විෂය පර්යේෂණ (Animal Subjects Research)
- මානව විෂය පර්යේෂණ (Human Subjects Research)
- යහපත් විද්‍යාගාර ක්‍රියාකාරකම් (Good Laboratory Practices)
- වගකීමකින් යුතුව පර්යේෂණ කටයුතු ඉටු කිරීම ( Responsible Conduct of Research)
- ජෛව සුරක්ෂිතතාව (Biosafety)
- ජෛව ආරක්ෂකතාව (Biosecurity)
- අභිලාෂයන් අතර ඝට්ටනය (Conflict of Interest)
- තොරතුරු රහස්‍යභාවය හා ආරක්ෂාව (Information Privacy and Security)

මේ සියලු පාඨමාලා ශ්‍රී ලාංකික ආයතනවල පර්යේෂකයන් සහ ආචාරධර්ම සමාලෝචන කමිටු සාමාජිකයන්ට සම්පූර්ණයෙන් ම නොමිලේ හැදෑරීමට අවස්ථාව ඇත. මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයට අදාළ විශ්වවිද්‍යාලයේ ආචාරධර්ම සමාලෝචන කමිටුවෙන් හෝ ජාතික විද්‍යා පදනමේ තොරතුරු තාක්ෂණ ඒකකයෙන් [madhawap@nsf.gov.lk] වැඩි විස්තර ලබා ගත හැකිය.

**මහේෂා නාදුගල**
**(විද්‍යාත්මක නිලධාරී,**
**ජාත්‍යන්තර සම්බන්ධතා අංශය,**
**ජාතික විද්‍යා පදනම)**



# "සංවර්ධිත රටවල් හා අප අතර ඇති තාක්ෂණික පරතරය පියවා ගත යුතුයි."

## - අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත -

*01 පිටුවෙන්...*

සම්මාන ප්‍රදානයේ දී, **පාසල් අංශයේ විශිෂ්ට නිර්මාණකරුවා ලෙස කැලණිය ගුරුකුල විද්‍යාලයේ ජේ. ඩබ්ලිව්. තිමිත් නවෝද්‍ය** (Rolls Machine) සිසුවා කනිෂ්ඨ දැසිස් සම්මානයෙන් පිදුම් ලැබීය. ඉන්දියානු නවෝත්පාදකයන්ගේ සංගමයේ සහ ඉන්දුනීසියානු නවෝත්පාදන සංගමයේ විශේෂ සම්මාන දෙකක් ද ඔහුට හිමි විය. **විවෘත අංශයේ විශිෂ්ටතම නිර්මාණකරුවා ලෙස වෛද්‍ය බී.ඩබ්ලිව්.කේ.එම්. බෝපැත්ත** මහතා (Accessory Device of Nebulization for Intubated Patients), සහ **වාණිජකරණය කරන ලද නිර්මාණ අංශයේ විශිෂ්ටතම නිර්මාණකරුවා ලෙස ප්‍රින්ස් චන්ද්‍රසේන** මහතා ද (Dipping Cooler) දැසිස් සම්මානයෙන් පිදුම් ලැබීය. බෝපැත්ත මහතා වෙත ලෝක නව නිපැයුම් බුද්ධිමය දේපළ සංගමයේ විශේෂ සම්මානයක් ද හිමි විය.

මෙහිදී අදහස් දැක්වූ අමාත්‍යවරයා, "කවුරු අපේ රටේ බලයේ සිටිය ද ජයගත යුතු යථාර්ථයක් තිබෙනවා. එනම්, සංවර්ධිත රටවල් සහ අප අතර තිබෙන තාක්ෂණික පරතරය පියවා ගැනීම යි. එම තාක්ෂණික පරතරය පියවා ගැනීමට නම් අපේ මානව සම්පත, අපේ ස්වභාවික සම්පත නිසි ලෙස ප්‍රයෝජනයට ගෙන නවෝත්පාදන ඇති කළ යුතුය. එම නවෝත්පාදනයන් තරගකාරී ලෙස ජාත්‍යන්තර වෙළෙඳපොළට ගෙන යා කළ යුතුයි. එහිදී විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හරහා අපේ නිෂ්පාදනවලට අමතර අගයක් එකතු කිරීමත්, ඒවායේ ගුණාත්මක තත්ත්වය දියුණු කිරීමත් අවශ්‍ය යි. ඒ සඳහා රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් 1% ක් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ යුතුයි. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා අපේ අමාත්‍යාංශයට නිවැරදි දැක්මක් සහ සැලසුම්ගත වැඩපිළිවෙළක් තිබෙනවා. ඒ ඉලක්කයට අපි ගමන් කරනවා" යනුවෙන් පැවසීය.

මෙහි දී සහසක් නිමැවුම් සම්මාන ප්‍රදානයට සමගාමීව, නව නිර්මාණ ශිල්පීන් සඳහා තමන්ගේ පර්යේෂණ කටයුතු සහ අධ්‍යයන කටයුතු සිදුකර ගැනීමට පහසුකම් සලසන නියමු පර්යේෂණාගාර 3ක් ඉදිකිරීම සහ නවෝත්පාදන ප්‍රවර්ධනය සඳහා මූල්‍යාධාර සැපයීමේ යාන්ත්‍රණය පිහිටුවීමේ සමාරම්භය සනිටුහන් කිරීම ද සිදුවිය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් සෙනෙවිරත්න, අමාත්‍යාංශ ලේකම් උදය ආර්. සෙනෙවිරත්න, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස් මහේෂ් එදිරිසිංහ මහත්වරුන්, රාජ්‍ය නිලධාරීන්, නව නිපැයුම්කරුවන් සහ පාසල් සිසුහු ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

**දුලිප් නයනප්‍රිය**
මාධ්‍ය ඒකකය
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

## 2017 විදාතා හරිත කඩමණ්ඩිය

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය එක්ව සංවිධාන කරන 'විදාතා හරිත කඩමණ්ඩිය – 2017' සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අලෙවි ප්‍රදර්ශනය පසුගියදා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත සහ රාජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් සෙනෙවිරත්න මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් කාර්මික තාක්ෂණ ආයතන පරිශ්‍රයේ දී ආරම්භ විය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ගමට තාක්ෂණය ගෙන යන "විදාතා" වැඩසටහනේ මූලික අරමුණ දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශ වෙත විද්‍යා හා තාක්ෂණික දැනුම ලබාදීම මගින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම යි. මේ පිරිස අතරින් දිවයිනේ සුපිරි වෙළෙඳසල්වලට සෘජුව තම නිෂ්පාදන බිහිකරන සහ විදේශීය වෙළෙඳපොළට උප ඇණවුම් ලබා දිය හැකි මට්ටමේ සාර්ථක ව්‍යවසායකයන් බිහි වී තිබේ.

රටේ ආර්ථික සංවර්ධනයට දායක කරගත හැකි මේ විදාතා ව්‍යවසායකයන් වෙත සමාජ අවධානය යොමු





කරවමින්, දැනුවත්භාවය සහ අවබෝධය මගින් වස විසෙන් තොර ගුණාත්මක දේශීය නිෂ්පාදන දිරිමත් කිරීම සහ ප්‍රචලිත කිරීම අරමුණු කරගනිමින්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය සහ රාජ්‍ය අමාත්‍යංශය විසින් විදාතා හරිත කඩමණ්ඩිය වාර්ෂිකව සංවිධාන කරනු ලබයි.

විදාතා මධ්‍යස්ථාන මගින් තාක්ෂණික අත්වැල ලබාගෙන සාර්ථක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් බවට පත් වූ 80 දෙනකුගේ සහභාගීත්වයෙන් විදාතා හරිත කඩමණ්ඩිය පැවැත්විණි. ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය සහ අලෙවිය මෙහිදී සිදුකෙරිණි. ආහාරමය නිෂ්පාදන, අත්කම් භාණ්ඩ, ඇඟලුම් නිෂ්පාදන, විසිතුරු භාණ්ඩ, දියරමය පිරිසිදු කාරක, ඉලෙක්ට්‍රෝනික උපාංග ආදී විවිධ ක්ෂේත්‍රවල නිෂ්පාදන සහ නවෝත්පාදනයන් රැසක් මෙවර ප්‍රදර්ශනයට ද එක්කොට තිබිණි.

**දුලිප් නයනප්‍රිය**

## 01 පිටුවෙන් ජාතික විද්‍යා පා ගමන...

එම වැඩසටහන් අතර විශේෂිත වූ අංගයක් ලෙස ජාතික විද්‍යා පා ගමන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත සහ රාජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් සෙනෙවිරත්න මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් නොවැම්බර් මස 11 දින පෙරවරුවේ පැවැත්විණි. තිරසර සංවර්ධන ඉලක්ක ජය ගනිමින් සංවර්ධිත රටක් නිර්මාණය කිරීමේ කාර්යයේ දී විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයේ කාර්යභාර්ය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම විද්‍යා පාගමන සංවිධානය කිරීමේ අරමුණ විය. කොළඹ 07, කාර්මික තාක්ෂණ ආයතන පරිශ්‍රයේ සිට විහාර මහා දේවී උද්‍යානය දක්වා මේ පා ගමන සංවිධානය කරන ලදී. මේ විද්‍යා පා ගමන සඳහා විද්‍යාඥයන්, පර්යේෂකයන්, විද්වතුන්, රාජ්‍ය නිලධාරීන්, පාසල් සිසුන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වී සිටි අතර පා ගමන සඳහා ප්‍රදර්ශන රථ රැසක් ද එක්කර තිබීම විශේෂත්වයක් විය.

## 01 පිටුවෙන් ආසියා පැසිපික්...

2017 ආසියා– පැසිපික් කලාපීය රැස්වීම මෙවර ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කෙරේ. මෙරට එම රැස්වීම නොවැම්බර් මස 29 හා 30 යන දෙදින තුළ පැවැත්වීමට නියමිත ය. නවසීලන්තයේ ව්‍යාපාර, නවෝත්පාදන සහ රැකී රක්ෂා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ජාතික විද්‍යා පදනම සමඟ මේ රැස්වීමෙහි සම සංවිධායකත්වය දරනු ලැබේ. ගෝලීය පර්යේෂණ කවුන්සිලයේ මෙවර ආසියා පැසිපික් කලාපීය රැස්වීමෙහි දී "සහෘද සමාලෝචන" සහ "විද්‍යා රාජ්‍යතාන්ත්‍රිකභාවය" යන මාතෘකා පිළිබඳව වෙන වෙන ම 29,30 දිනයන්හි දී සලකා බැලේ. නවසීලන්තයේ ව්‍යාපාර, නවෝත්පාදන හා රැකී රක්ෂා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ආචාර්ය පෘඩන්ස් විලියම්ස් මහත්මිය සහ ජාතික විද්‍යා පදනමෙහි සභාපති මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මහත්මිය විසින් මුලසුන් හොබවනු ලබයි. මේ කලාපීය රැස්වීමට විදේශිකයන් 40ක් හා දේශීය වශයෙන් 20 දෙනකු පමණ සහභාගි වෙතැයි අපේක්ෂා කෙරේ.

**තිළිණා කුමාරි කඳනමුල්ල**
(විද්‍යාත්මක නිලධාරී,
ජාත්‍යන්තර සම්බන්ධතා අංශය,
ජාතික විද්‍යා පදනම)

## 01 පිටුවෙන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ...

පාසල් දරුවන්, ග්‍රාමීය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, ස්වයං රැකියාවල නියුක්ත වූවන්, විශ්වවිද්‍යාල සිසුන්, විද්‍යාඥයන්, තාක්ෂණවේදීන්, පර්යේෂකයන්, විද්වතුන් දායක කරගනිමින් ඉහළ මැදි ආදායම් ලබන රටක තත්ත්වයට සංවර්ධිත ඉලක්ක ජයගැනීම මෙහි අරමුණ වේ. නිසි සැලසුම් සහිතව ඉතා වැදගත් වැඩසටහන් ගණනාවක් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබයි.

එම අරමුණු ජය ගනිමින් රට තුළ පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කරගැනීම ඔස්සේ නවෝත්පාදනය මත පදනම් වූ ආර්ථිකයක් නිර්මාණය කරගැනීමට අවශ්‍ය මැදිහත්වීම සිදු කළ හැකි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ ව උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්වකරුවන්ට පහසු වන ලෙස නිර්මාණය කර ඇති මේ www.mostr.gov.lk වෙබ් අඩවිය හරහා සම්බන්ධ වන ලෙස විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය ආරාධනය කර සිටී.

# විද්‍යාත්මක අභිවෘද්ධියට කැප වන ජාතික විද්‍යා පදනම

ජාතික විද්‍යා පදනම (NSF) 1994 වර්ෂයේ අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත යටතේ, ශ්‍රී ලංකා ස්වභාවික සම්පත් බලශක්ති සහ විද්‍යා අධිකාරියෙහි අනුප්‍රාප්ත ආයතනයක් ලෙස 1998 වසරේ දී පිහිටුවන ලදී. ස්වභාවික සම්පත් බලශක්ති සහ විද්‍යා අධිකාරිය (NARESA) 1981 දී ආරම්භ වන්නේ, 1968 දී ස්ථාපිත වූ ජාතික විද්‍යා සභාවෙහි (NSC) අනුප්‍රාප්ත ආයතනය වශයෙනි. වර්තමානය වනවිට ජාතික විද්‍යා පදනම, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලාංකික ජනතාවගේ සුභසිද්ධිය උදෙසා (NARESA)දැනුම ඵලදායි ලෙස සම්ප්‍රේෂණය වෙනුවෙන් කැපවී සිටියි. විද්‍යාව මත පදනම් වූ පර්යේෂණ , සංවර්ධන සහ තාක්ෂණික ප්‍රවර්ධන, ප්‍රතිපත්ති විද්‍යාත්මක පර්යේෂණ, ජාත්‍යන්තර සබඳතා සහ පාසල් දරුවන් හා මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම වෙනුවෙන් බිහි වී ඇති මූලිකම ආයතනය යි. එහිදී ජාතික විද්‍යා පදනම මඟින් විද්‍යා හා තාක්ෂණ ප්‍රජාවේ විවිධ වූ පැතිකඩ වැඩමුළු, සම්මන්ත්‍රණ, කමිටු සහ අනෙකුත් ක්‍රියාකාරකම් සමඟින් ඒකරාශී කරයි. එසේම මෙමඟින් පර්යේෂණ සංවර්ධන සහ නව සොයාගැනීම් සඳහා නිර්නායකයන් සහ නායකත්වය සපයයි. එමෙන්ම ජාතික විද්‍යා පදනම මඟින් ප්‍රධාන වශයෙන් ම ජාතික හා අන්තර්ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රමුඛතා ආමන්ත්‍රණය කරන ව්‍යූහාත්මක සහයෝගීතා සඳහා ද ආධාර සපයනු ලබයි.

ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ අභිවෘද්ධිය උදෙසා විද්‍යාව තාක්ෂණය හා නව සොයාගැනීම් ප්‍රවර්ධනය සඳහා වූ ජාතියේ ප්‍රමුඛතම සවිබල ගැන්වීමේ ආයතනය ලෙස කටයුතු කිරීමේ දැක්ම සහිතව ක්‍රියාත්මක වේ. ජාතික විද්‍යා පදනම එමඟින් ආධාර, දැනුම නිර්මාණය කිරීම, ශක්‍යතා ගොඩනැගීම, හවුල් ව්‍යාපාර, තොරතුරු සම්පාදනය කිරීම සහ විද්‍යාව ප්‍රචලිත කිරීම හරහා විද්‍යාව පදනම් වූ පර්යේෂණ සංවර්ධන, නව සොයාගැනීම් සහ තාක්ෂණ සම්ප්‍රේෂණයන් ක්‍රියාත්මක කර පහසුකම් සලසා සහාය දැක්වීමේ මෙහෙවරෙහි නිරතව සිටියි. එහිදී දැනුම මත දිවෙන ආර්ථිකයක් නිර්මාණය කිරීම සහ ඉතා ඵලදායි ලෙස දැනුවත් වූ සමාජයක් නිර්මාණය කිරීම, ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟාසිටුවීම සඳහා දායකත්වය සැපයීම සිදු කරයි. කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් මඟින් විනිවිදභාවය, වගකීම සාධාරණත්වය, සමානාත්මතාව සහ තිරසර ප්‍රතිපත්තීන් සුරක්ෂිත කිරීම සිදු වේ.
විශ්වවිද්‍යාල, විද්‍යා හා තාක්ෂණ ආයතන සහ විද්‍යාඥයන් විසින් මෙහෙයවනු ලබන මූලික සහ ව්‍යවහාර විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, ඒවාට පහසුකම් සැලසීම සහ සහාය දැක්වීම, විද්‍යාත්මක පර්යේෂණ සමාජ විද්‍යාත්මක පර්යේෂණ සහ විද්‍යා අධ්‍යාපන වැඩසටහන් සවිබල ගැන්වීම සිදු කෙරේ.
ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය කිරීම, ශ්‍රී ලාංකීය ජනතාවගේ සුභසිද්ධිය සංවර්ධනය කිරීම, විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ පිරිස් පුහුණු කිරීම සඳහා ජාතික විද්‍යා පදනම ක්‍රියාත්මක වේ.
එසේම ශ්‍රී ලාංකික සහ විදේශීය විද්‍යාඥයන් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරුව පෝෂණය කිරීම, පිළිගත් විද්‍යා හා තාක්ෂණ ආයතනවල විද්‍යාත්මක අධ්‍යයන හෝ ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යත්ව සහ අධි ශිෂ්‍යත්ව ප්‍රදනය කිරීම, වර්තමාන විද්‍යා හා තාක්ෂණික සේවා මණ්ඩල පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාම, ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක හා තාක්ෂණික සම්පත්වල පැවැත්ම සහ ඒවායෙහි ඉලක්කගත සහ වර්තමාන අවශ්‍යතාව තහවුරු කිරීම සහ විද්‍යා හා තාක්ෂණ සහ අනෙකුත් ක්ෂේත්‍රයන් හි ප්‍රතිපත්ති සම්පාදනයට තොරතුරු උත්පාදනය කිරීම මෙන්ම විද්‍යාව මත පදනම් වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒවාට ආධාර සැපයීම මඟින් ජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම උදෙසා ඇපකැප වී සිටියි.




# නවතම පර්යේෂණ රැසකට මූලාධාර දෙන්න අපි සූදානම්

## මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු, සභාපතිනි - ජාතික විද්‍යා පදනම



**● ජාතික විද්‍යා පදනමේ වසර 50ක ගමන්මග සැකසුණේ කොහොමද?**

ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය දියුණු කිරීමට හා දිරිගැන්වීමට 1968 දී ජාතික විද්‍යා සභාව ලෙස මෙය ආරම්භ වෙන්නේ. ස්වභාවික සම්පත්, බල ශක්ති හා විද්‍යා අධිකාරිය (NARESA) බවට මෙය පත් වන්නේ වෙන ම බලතල ඇති ආයතනයක් ලෙස යි. ඉන්පසු 1994 දී විද්‍යා, තාක්ෂණ සංවර්ධන පනත මඟින්, ජාතික විද්‍යා පදනම ස්ථාපිත කෙරෙනවා. මෙය පාර්ලිමේන්තුව මඟින් සම්මත කළ පනතක් සහිතව සභාපති ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය වන ආයතනයක්. මෙහි 150ක පමණ කාර්ය මණ්ඩලයක් රාජකාරියේ නියැළෙනවා. අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස අප විසින් ගනු ලබන තීරණ ක්‍රියාවට නංවන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ සේවය කරන පිරිස විසිනුයි. එසේ කටයුතු කරන අයට උදව් කරන්න අපට ක්‍රියාකාරී කමිටු සාමාජිකයන් 150ක් පමණ ඉන්නවා. ඒ වගේම තවත් 150ක් පිටත සිට අපට සහාය දක්වනවා. අපේ ප්‍රමුඛතම කාර්යය වෙන්නේ පර්යේෂණ සඳහා මූල්‍යාධාර සැලසීම යි. ඒ අනුව ශ්‍රී ලංකාවේ පළමු වරට පර්යේෂණ ආධාර ලබා දෙන ආයතනය බවට පත්වුණේ ජාතික විද්‍යා පදනම යි. 1972 දී මෙලෙස පර්යේෂණ ආධාර දීම ආරම්භ කළේ. එතැන් පටන් අපි නොකඩාව ම පර්යේෂණ ආධාර ලබා දී තිබෙනවා.
කෘෂිකර්ම, වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු හා සමාජ විද්‍යා, විද්‍යා අධ්‍යාපන යන සෑම ක්ෂේත්‍රයට ම පර්යේෂණ ආධාර දීම සිදු කෙරෙනවා.
විද්‍යාත්මක පර්යේෂණයක මූල බීජය වන අදහස අප සමඟ සාකච්ඡාවට ලක් කිරීමේ දී පර්යේෂකයා විසින් එය යෝජනාවලියක් ලෙස ඉදිරිපත් කරනු ලබනවා. මෙහි දී ඒ පිළිබඳ සොයා බැලීමට

30

දෙනකුගෙන් පමණ සමන්විත කණ්ඩායමක් මඟින් සිදු කෙරෙනවා. ඒ අනුව එම යෝජනාවලියේ සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡාවට ලක්කර, එම පර්යේෂණය සමාජයට කොතෙක් දුරට වැදගත් ද කියන කරුණු සොයා බලනවා.

**● පර්යේෂණ ආධාර ලබාදීමේ ක්‍රමවේදය කුමක්ද?,**

අපිට පර්යේෂණාධාර සඳහා මුදල් ලැබෙන්නේ මහා භාණ්ඩාගාරයෙන්. එම නිසා ඒවා සමාජයට වැඩදායී අයුරින් යොදා ගැනීමේ වගකීම ආයතනයක් ලෙස අප සතු වෙනවා. මූල්‍යාධාර දීමෙන් අනතුරුව අපි මාස 6කට පසුව ප්‍රගති සමාලෝචනයක් සිදු කරනු ලබනවා.
එසේම පර්යේෂණයට අදාළ වාර්තා ලබාගැනීම සහ අප විසින් ලබාදෙන මුදල් එම පර්යේෂණය සඳහා වැඩදායි අන්දමින් යොදා ගන්නවා ද යන කරුණු පිළිබඳවත් සොයා බලනවා.
පර්යේෂණවල ප්‍රගතිය මැන බලන්න ඇතැම් විට අපි ඒ අයව ජාතික විද්‍යා පදනමට ගෙන්වනවා. නැතිනම් අපි ඒ ආයතනවලට ගොස් ප්‍රගතිය සොයා බලනවා. විද්‍යාඥයා කියන කෙනාව අපි පුහුණු කරලා තිබෙන්නේ ම සිතන්න. මොකක් හරි ප්‍රශ්නයක් දිහා බලලා ඒ ප්‍රශ්නයට විද්‍යානුකූලව විසඳුමක් සොයා ගැනීමට තමයි පර්යේෂණයක් සිදු කෙරෙන්නේ. මේ අනුව පර්යේෂකයා තනි තනිවමයි සිතන්නේ. මේ නිසා අපට ලබා ගත යුතු ප්‍රතිඵලය රටට ප්‍රයෝජනවත් හා කර්මාන්ත ආදියට අවශ්‍ය ආකාරයට මේවායෙහි ප්‍රතිඵල යොදා ගැනීමට තිබෙන අවස්ථා අඩුයි. අපි ඒ සඳහා වෙන ම වැඩපිළිවෙළක් සකස් කළා. අපි අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස රැස් වී රටේ පවතින ප්‍රශ්නවලට විසඳුම් සොයමින් ඒ ඔස්සේ පර්යේෂණ සිදු කරන්න කියන පණිවිඩය පර්යේෂකයාට ලබා දෙන්න පියවර ගන්නවා.

**● රටේ කාලීන අවශ්‍යතාවලට ගැළපෙන පර්යේෂණ කෙරෙහි අවධානය යොමු කර තිබෙනවාද?**

රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, ජල සුරක්ෂිතතාව, බල ශක්ති සුරක්ෂිතතාව ආදි ලෙස අපි තේමා තෝරාගෙන අද කාලයේ අපට තිබෙන අවශ්‍යතා හඳුනාගෙන, “එන්න ඔබ මේ කියන ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ කරන්න.” කියන ආරාධනය සිදු කරනවා. සාම්ප්‍රදායික ලෙස ඒ අයගේ මනසින් කරන පර්යේෂණයට මූල්‍යාධාර සැපයීම වගේම, අප විසින් ලබාදෙන කාලීන අවශ්‍යතා පදනම් කරගත් තේමාවට අනුව පර්යේෂණ සඳහා මූල්‍යාධාර සැපයීම සිදු කරනවා. ආහාර සුරක්ෂිතතාව, ජල සුරක්ෂිතතාව හා කාලගුණ වෙනස්වීම් වගේම වෛද්‍ය විද්‍යාත්මක ක්ෂේත්‍රය සඳහා පර්යේෂණ යෝජනාවලි කැඳවනු ලබනවා.
වෛද්‍ය විද්‍යාත්මකව සිදුකෙරෙන පර්යේෂණ ක්ෂේත්‍රයේ පිළිකා, ඩෙංගු , දියවැඩියා හා වකුගඩු රෝග ප්‍රශ්නය පිළිබඳවත් පර්යේෂණ සිදු කිරීමට අපේ අවධානය යොමුවුණා. දැන් එය ආරම්භ වී තිබෙනවා. මේ සියල්ල සිදු කරන්න අපි පර්යේෂණාධාර ලෙස ලබා දෙන්නේ මූල්‍යාධාර, උපකරණ හා තනිවම පර්යේෂණ කළ නොහැකි නිසා සහායට ගනු ලබන අයට පර්යේෂණ කාලයට අදාළව ගෙවීමක් සිදු කරනවා. මේ සියලු දේ සිදු කෙරෙන්නේ යෝජනාවලිය මඟින් ඉදිරිපත් කළ කාරණා මත පර්යේෂකයා හා ජාතික විද්‍යා පදනම එක්ව ඇති කරගනු ලබන අවබෝධතා ගිවිසුමකට අනුවයි.
පර්යේෂණයක ප්‍රතිඵලය රටට වැඩදායක විය යුතුයි. එය සමාජයීය, ආර්ථික හා පරිසරික අතින් වැදගත් විය යුතුයි. ඒ වගේම මේ අදහස කොතරම් අලුත් ද? අනාගතය සඳහා එය කොතරම් වැඩදායක ද යන කරුණ වගේම පර්යේෂකයා ඇතුළු කණ්ඩායමට එම පර්යේෂණය සාර්ථකව කරගෙන යෑමට හැකියාව තිබෙනවා ද යන කරුණු මෙහිදී සොයා බැලෙනවා. තිබෙන සම්පත් හා ඉල්ලා සිටින සම්පත් පර්යේෂණයට ඉවහල් කරගන්නා අකාරය, පර්යේෂණයෙන් ඔබ්බට යාමේ දී ඒ අයත් අපේ අපේක්ෂාවන් හා එය සමාජගත කිරීමට දක්වන දායකත්වය ආදිය සලකමිනුයි අපි ඒ අයට මූල්‍යාධාර ලබාදීම පිළිබඳව තීරණය කරන්නේ. අපි පරීක්ෂණාධාර 100ක් දුන්නා ම එයින් 23යි සාර්ථක වෙන්නේ. එය ලෝකයේ ම පර්යේෂණවල සාමාන්‍ය ප්‍රතිශතය යි. ඕනෑම රටක මිනිසුන්ගේ දැනුම දියුණු කරන්න මිනිසුන්ට සිතන්න දෙන්න ඕනෑ. එවන් පර්යේෂණ මඟින් ලබාගන්නා ප්‍රතිඵල ඵලදායී කරගන්න ජාතික විද්‍යා පදනම ලෙස අපි නිරන්තරයෙන් ඒ අයව ඥණනය කරන්න කැප වෙනවා.

**ප්‍රමිතා රන්දලී පබසරා**
**ඡායාරූප - තුෂාර ප්‍රනාන්දු**

# විද්‍යාව ප්‍රචලිත කිරීම යුගයේ අවශ්‍යතාවයි

## ආචාර්ය ජයන්ත වත්තේවිදානගේ
## අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) - ජාතික විද්‍යා පදනම



**● විද්‍යාව ප්‍රචලිත කිරීම උදෙසා ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරීත්වය කෙබඳුද?**

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ නංවාලීම, ප්‍රචලිත කිරීම, නවෝත්පාදන සහ නව නිර්මාණ බිහි කිරීම හා අවසානයේ මේ සියල්ල ආර්ථික සංවර්ධනය කරා ගෙන යාමේ අරමුණු සාක්ෂාත් කරලීම උදෙසා ජාතික විද්‍යා පදනම නිරන්තරයෙන් සිය ක්‍රියාකාරී දායකත්වය සපයන්නේ ඉමහත් කැපවීමකින් යුතුව යි. ඒ අනුව මෙහි දී ජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම වෙනුවෙන් වෙන ම අංශයක් ස්ථාපිත කර ඒ ඔස්සේ සුවිශේෂී කාර්යභාරයන් රැසක නිරත වෙනවා. ඒ අනුව විද්‍යාව ප්‍රචලිත කිරීමේ කමිටුව සහ STEM අධ්‍යාපනය නඟාසිටුවීමේ කමිටුව හරහා සියලු කටයුතු ක්‍රියාත්මක යි. මේ කමිටු හරහා “සැමට විද්‍යාව” තේමාව යටතේ ශ්‍රී ලංකාව පුරාවිද්‍යාව ප්‍රචලිත කිරීමට කටයුතු ක්‍රියාත්මක වෙනවා. මෙහිදී පාසල් ප්‍රජාව, විශ්වවිද්‍යාල ප්‍රජාව, පොදු මහජනතාව, ආදී සමාජ කණ්ඩායම් පිළිබඳව අවධානයෙන් යුතුව කටයුතු කිරීම වැදගත්. මේ වන විට අපේ රටේ සියලු ම දිස්ත්‍රික් ආවරණය වන පරිදි පාසල් 848ක් පමණ පාසල් විද්‍යා සමාජ හරහා NSF හි ලියාපදිංචි වී සිටිනවා. ඒ අනුව ඔවුන්ට විද්‍යා ක්ෂේත්‍රයෙහි ජාතික වේදිකාවක් අප විසින් සකසා දී තිබෙනවා. ඒ අනුව විද්‍යා දැනුම අන්තර්ගත “විදුරාව” සඟරාව භාෂා තුනෙන් ම මුද්‍රණයකර පාසල් විද්‍යා සමාජවලට ලබා දෙනවා. ඒ වගේම විද්‍යා සමාජ මඟින් විද්‍යා වැඩසටහන් සඳහා ඉල්ලුම් කළ විට විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතනවලින් අවශ්‍ය විද්‍යාඥයන් සම්පත්දායකයන් වශයෙන් යොමු කිරීමත් NSF මඟින් සිදු කරනවා.

**● විද්‍යා දින සැමරුම් අවසන් මහෝත්සවය පිළිබඳ කතා කළොත්,**

ජාතික විද්‍යා පදනම හරහා ලෝක විද්‍යා දින සැමරුමට සමගාමී විද්‍යා සමාජ අතර තරග සංවිධානය කිරීම සිදු වුණා. ඒ අනුව මේ වසරේදීත් ඒ ඒ පාසල්වල ජයග්‍රාහකයන් ප්‍රාදේශීය තරගවලට ඉදිරිපත් කර, ඉන් ජයගත් පිරිස මැයි මස 04 වැනිදා පැවැත්වෙන අවසන් මහෝත්සවයට ඉදිරිපත් කරනවා. මෙහිදී ජයග්‍රාහකයන්ට, හොඳ ම ගුරුවරයාට හිමි ජාතික සම්මානය, විද්‍යාව ප්‍රචලිත කිරීම වෙනුවෙන් මහාචාර්ය ජෙෆ්රි අනුස්මරණ සම්මාන පිදීමට නියමිතයි. ඒ වගේම ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය සමගාමීව පැවැත් වෙනවා. එහි දී පළමු ජයග්‍රාහකයන් තිදෙනා ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයට (INTELL) ISEFඅමෙරිකාවට යවා ඔවුන්ගේ ඉදිරි කටයුතු සඳහා අවස්ථාව පුළුල් කර දෙනවා.

**● මූල්‍යාධාර ලබාදීම සිදුවන්නේ කෙසේද?**

ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක පර්යේෂණ සඳහා ආධාර ලබා දෙන ප්‍රමුඛතම ආයතනය වන්නේ ජාතික විද්‍යා පදනම යි. ඒ අනුව පර්යේෂණ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ විට ඒ ඒ ක්ෂේත්‍රයට අයත් කමිටු හරහා එම ව්‍යාපෘති යෝජනා විශ්ලේෂණය කර ඒ අනුව ප්‍රතිපාදන ලබාදීම සිදු වෙනවා. ඒ අනුව පර්යේෂණ ව්‍යාපෘතිවලට, අදාළ උපකරණවලට පර්යේෂණ ආධාර පිරිනැමෙනවා. ඒ වගේම ජාත්‍යන්තර සමුළු සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ විට එම සමුළුවේ ලියාපදිංචි වීමට, ගුවන් ගමන් බලපත්‍ර ලබාගැනීමට ප්‍රතිපාදන ලබාදෙනවා. ඊට අමතරව දේශීය වශයෙන් පවත්වන වැඩමුළු, සම්මන්ත්‍රණ සඳහා විදේශීය විද්‍යාඥයන් ගෙන්වා ගැනීමට, ඒ ඒ ආයතන සඳහා ගුරුවරුන්ට, ශිෂ්‍යයන්ට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරනු ලබන්නේත් ජාතික විද්‍යා පදනම මඟිනුයි.

**● නව වසරේ ඉදිරි වැඩපිළිවෙළ සකස්වන්නේ කෙසේද?**

ඉදිරි වසර කියන්නේ අපට සුවිශේෂී වර්ෂයක්. අපේ 50 වැනි සංවත්සර සැමරුම යෙදී තිබෙන්නේ 2018 වසරේ මැයි මාසයට යි. ඒ අනුව එහි දී ප්‍රධාන අංශ දෙකක් යටතේ ඇගයීමට ලක් කළ යුතු පුද්ගලයන් ඇගයීමට අපි අපේක්ෂා කරනවා. ඒ අනුව දීර්ඝ කාලයක් සේවය කර විවිධ මට්ටම්වල සිටින පුද්ගලයන් හා දේශීය, විදේශීය වශයෙන් ආයතනය හා දැඩි ලෙස සම්බන්ධ වන ආචාර්ය මහාචාර්යවරු මෙහිදී ඇගයීමට ලක්වෙනවා. NSF ජර්නලයෙහි විශේෂ ස්වර්ණ ජයන්ති වෙළුමක් ඉදිරිපත් වෙනවා. ඒ වගේම මේ සැමරුම පාසල් ශිෂ්‍යයන්, ගුරුවරුන්, විද්‍යාඥයන් හා සියලු දෙනා එක්ව සෑම අංශයක ම විශේෂත්වයක් ඇති කරමින් වඩා ඵලදායී අයුරින් සැමරීමට නියමිතයි.
ඒ වගේම මේ වන විට පිටිපන ප්‍රදේශයේ අක්කර 50ක භූමිභාගයක ඉදිවන ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය විවෘත කිරීම වසරේ තවත් සුවිශේෂී සංධිස්ථානයක්. තට්ටු 15කින් ඉදිවන මේ ආයතනය ආරම්භ කිරීමත්, ඊට සමගාමීව සුවිශේෂී අරමුදලක් ස්ථාපිත කිරීමටත්, NSF කාර්යභාරය වෙනදාටත් වඩා ශක්තිමත් අයුරින් ඉටු කිරීමටත් අපි අපේක්ෂා කරනවා.

**ඩබ්. ඒ. එස්. නිසංසලා කුමාරි**
**ඡායාරූපය - සරත් පීරිස්**



# ජාතික තේමා මූලික පර්යේෂණ වැඩසටහන

ජාතික විද්‍යා පදනම මගින් ක්‍රියාවට නංවන ලද ජාතික තේමා මූලික පර්යේෂණ වැඩසටහන් යටතේ සුවිශේෂී පර්යේෂණ ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ක්‍රියාවට නංවා ඇත. ඒ යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආචාර්ය ආර්. එම්. හේරත් මහතා ඇතුළු කණ්ඩායම විසින් මෙහෙය වන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යනාංශයේ තාක්ෂණික, විශේෂඥ දැනුම භාවිතයෙන් නිපදවන ලද ආහාර නිෂ්පාදන ඇගයුම් මෘදුකාංගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මුළු දිවයිනෙහි ම ආහාර නිෂ්පාදනය ඇගැයීම හා කරුණු එක්රැස් කිරීම සඳහා යොදා ගැනීමට තීරණය කර ඇති අතර, මේ මෘදුකාංගය ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යනාංශයේ මහාචාර්ය ගිහාන් වික්‍රමනායක මහතා හා ඔහුගේ කණ්ඩායම විසින්, භෝග වගාවන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට, එම තොරතුරු ගොවීන් හට ලබාදීම සඳහා වෙබ් අඩවි තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ඇත. යාපනය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජී. මිකුන්තන් මහතාගේ අධීක්ෂණය යටතේ ආදර්ශ ගොවිපොළක් කෘෂිකර්ම පීඨය මගින් පවත්වාගෙන යනු ලබන අතර, මෙමගින් උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහක තෝරාගත් ගොවීන් හට ඔවුන්ගේ ගෙවතු පිහිටුවා ගැනීමට දැනුවත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

# ජාතික විද්‍යා පදනම් ජර්නලය




වසර 1973 දී ආරම්භ කරන ලද ජාතික විද්‍යා පදනම් ජර්නලය (Journal of the National Science Foundation of Sri Lanka - JNSF), දේශීය හා විදේශීය විද්‍යා හා තාක්ෂණ පර්යේෂණයන්ගේ ප්‍රතිඵල, දත්ත ආදිය ප්‍රකාශනයට පත්කරයි. වසරක් ඇතුළත මාර්තු, ජූනි, සැප්තැම්බර් හා දෙසැම්බර් මාසවල ජර්නලයේ කලාප හතරක් ප්‍රකාශයට පත් කරනු ලැබේ. මේ ජර්නලයේ පර්යේෂණ පත්‍රිකා සුමියුරු සමාලෝචනයට (peer - review) ලක් කෙරෙන අතර, මෙය විවිධ සුචිගත කරන දත්ත ගබඩාවල ඇතුළත් කෙරේ. ජර්නලයේ 2017 ට අදාළ බලපෑම් සාධකය (Impact Factor) 0.42ක්වේ.

ජාතික විද්‍යා පදනම් ජර්නලය මුද්‍රිත මාධ්‍යයෙන් ප්‍රකාශ වන අතර, එය අන්තර් ජාලයට ද මුදා හැරේ. ජර්නලයට ජාතික හා අන්තර් ජාතික වශයෙන් පුළුල් සංසරණයක් පවතින අතර, ප්‍රකාශ වන පර්යේෂණ පත්‍රිකා මුදල් ගෙවීමකින් තොරව Sri Lanka Journals Online (SLJOL)වෙබ් අඩවියෙන් (http://jnsfsl.sljol.info/)බා ගත හැකිය. ජර්නලය පිළිබඳ වැඩිදුර තොරතුරු පහත වෙබ් ලිපිනයෙන් ද ලබා ගත හැකි වේ.

**http://www.nsf.ac.lk/index.php/nsf-science-magazine.**



# මුරුංගා ආශ්‍රිත අනර්ඝ නිමැවුම්

## රෝග රැසකට පිළියම්

මුරුංගා (Moringa oleifera) යනු ඉතාම ප්‍රයෝජනවත් නිවර්තන ශාකයන්ගෙන් එක් ශාක වර්ගයකි. එය ශ්‍රී ලංකාවේ ජනප්‍රිය එළවළුවක් සේම, වියළි කලාපයේ බහුලව වැවෙන ශාකයක් ද වේ. මුරුංගා, ඈත අතීතයේ සිට සාම්ප්‍රදායික ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ ලෙඩ රෝග රාශියකට ඖෂධයක් වශයෙන් භාවිත කොට ඇත. විශේෂයෙන්ම නීරක්තිය, සමේ ආසාදන, කාන්සාව, බ්‍රොන්කයිටීස්, පීනස, හෘද අවහිරතා, ඇදුම, රුධිරගත අපද්‍රව්‍ය, කොළ රාව, ග්‍රන්ථි ආශ්‍රිත රෝග, ඉදිමීම්, හිසේ අමාරු, සංසන්ධිත දහය, කැස්ස, පාචනය, ඇස් සහ කන් ආසාදන, උණ, අසාමාන්‍ය රුධිර පීඩනය, හිස්ටීරියාව, සන්ධි වේදනා, කුරුළෑ, ශ්වසන ආබාධ, ශ්‍රීතාද රෝගය, ශුකාණු ඌණතාව, උගුර ආසාදන, උලුක්කු, ක්ෂය රෝගය, බඩවැල් ආශ්‍රිත පණුවන්, සහ දියවැඩියාව එම රෝග තත්ව වේ.




මුරුංගා ශාකය ඉතා විශාල ප්‍රයෝජන රාශියක් සහිත බහුකාර්ය ශාකයක් ලෙස යළි අනාවරණය කරගෙන ඇත. මේ ශාකයේ කොළ ඉතා පෝෂ්‍යදායී සහ විටමින් 'ඒ', කැරොටීන්, විටමින් බී, ප්‍රෝටීන, යකඩ, පොටෑසියම් සහ කැල්සියම්වලින් පොහොසත් බව සොයාගෙන ඇත. විවිධ වූ විද්‍යාත්මක වාර්ථා මගින් පෙන්වා දී ඇති පරිදි මේ ශාකයේ කොළ තුළ, කැරට්වලට වඩා වැඩි විටමින් 'ඒ' ප්‍රතිශතයක් ද, කිරිවලට වඩා වැඩි කැල්සියම් ප්‍රමාණයක් ද, නිවිතිවලට වඩා වැඩි යකඩ ප්‍රමාණයක් ද, දෙඩම්වලට වඩා වැඩි විටමින් 'බී' ප්‍රමාණයක් ද, කෙසෙල්වලට වඩා වැඩි පොටෑසියම් ප්‍රමාණයක් ද, කිරිවලට වඩා වැඩි ප්‍රෝටීන ප්‍රමාණයක් ද අන්තර්ගත බවට සොයාගෙන ඇත. මුරුංගා කොළ අමුවෙන් ආහාරයට ගත හැකි අතර විවිධ වූ රසවත් ව්‍යාංජන සහ ඖෂධ සකස් කිරීමට ද භාවිත කළ හැකිය. තවද වියලූ මුරුංගා කොළ කුඩු කිසිදු විශේෂිත පෝෂණ ගුණාංග විනාශ වීමකින් තොරව මාස ගණනක් ගබඩා කර තබා ගත හැකිය. එම නිසා, මෑත දශක කිහිපය තුළදී, මුරුංගා ශාකය "නිවර්තනයේ ස්වභාවික පෝෂණය" ලෙස, දියුණුවෙමින් පවතින ඉන්දියාව, පාකිස්ථානය, පිලිපීනය, හවායි සහ අප්‍රිකාවේ ප්‍රදේශ රාශියක කුඩා දරුවන්ගේ සහ කිරි දෙන මව්වරුන්ගේ මන්දපෝෂණය ජය ගැනීමට, ඉතා විශාල අවධානයක් දිනා ගෙන ඇත.












## මුරුංගා සම්බන්ධ ITI පර්යේෂණ

කාර්මික තාක්ෂණ ආයතනය රටේ පුරෝගාමී බහු විධමය පර්යේෂණ ආයතනයක් වශයෙන්, 2011 මුල් භාගයේ දී ITI හි ඖෂධ තාක්ෂණ අංශය, මුරුංගා පිළිබඳව පර්යේෂණ ආරම්භ කරන ලදී. මේ පර්යේෂණයට මූල්‍ය දායකත්වය ශ්‍රී ලංකා භාණ්ඩාගාරයෙන් සිදු කළ අතර, වෛද්‍ය ජී. ඒ. එස්. ප්‍රේමකුමාර, ඩබ්. පී. කේ. එම්. අබේසේකර මෙනවිය, වෛද්‍ය ඩබ්. කේ. එස්. එම්. අබේසේකර සහ වෛද්‍ය පී. රණසිංහ ඇතුළු පර්යේෂකයන් කිහිපදෙනෙක් මේ ව්‍යාපෘතියට සම්බන්ධ විය. මෙහි මූලික අධ්‍යයනයන් මගින් මේ ශාකයේ කොළවල පවතින විවිධාකාර වූ පෝෂණීය සහ කෘත්‍යාත්මක ගුණාංග හඳුනා ගැනීමට හැකිව තිබේ.

## මුරුංගා කොළ හා අගය එක් කළ නිෂ්පාදන

එම පදනම යටතේ, මුරුංගා කොළ ආශ්‍රිතව අගයන් එක් කළ නිෂ්පාදන සකස් කර තිබේ. විද්‍යාත්මකව සනාථ කළ එම අගයන් එක් කළ මුරුංගා කොළ ආශ්‍රිත නිෂ්පාදන දේශීය වෙළඳපොළේ මිල දී ගැනීමට නොමැත. වැඩි දියුණු කළ අගයන් එක් කළ නිෂ්පාදන අතර පෝෂ්‍යදායී සහ කෘත්‍යාත්මක ලෙස වැඩි දියුණු කළ මුරුංගා තේ සහ මුරුංගා කොළ කුඩු, සම පැහැපත් කරන, සම වයසට යාම පාලනය කරන මුරුංගා ක්‍රීම් අන්තර්ගතය.

මුරුංගා කොළ කුඩු සහ මුරුංගා තේ වැනි වැඩි දියුණු කළ නිෂ්පාදන , බොහෝ ජීව විද්‍යාත්මක ක්‍රියාකාරීත්වයන්ගෙන්, සහ පෝෂණයෙන් පොහොසත් නිසා ඒවා අප රටේ මන්දපෝෂණයෙන් පෙළෙන කුඩා දරුවන්ට සහ කිරි දෙන මව්වරුන්ට ප්‍රයෝජනවත් විය හැකිය. තවද මුරුංගා ක්‍රීම් නිෂ්පාදනය SLS වර්ගීකරණයේ අවශ්‍යතා සමග සැසඳී ඇති අතර, එය විලවුන් කර්මාන්තයට නව නිෂ්පාදනයක් ලෙස එකතු විය. කෘත්‍රිම සම පැහැපත් කරන ආලේපනවල අතුරු ආබාධ වැඩි බැවින්, මේ නිෂ්පාදනය පාරිභෝගිකයන්ට වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. කෙසේ නමුත් මේ සම පැහැපත් කරන සහ සම වයස්ගත වීම අවම කරන නිෂ්පාදනවල විභව ශක්තිය සහ ස්ථාවරභාවය පිළිබඳව වැඩිදුර සායනික අධ්‍යයන ඉදිරිපත් වනු ඇත.

වැඩි දියුණු කළ, අගයන් එක් කළ මුරුංගා ආශ්‍රිත නිෂ්පාදනවල තාක්ෂණයන් පාරිභෝගිකයන්ට ITI මගින් තාක්ෂණ පැවරීමක් ලෙස ලබාගත හැකිය. ඒ අනුව මුරුංගා කොළ කුඩු නිෂ්පාදනයේ තාක්ෂණය 2014 දී පවරා දෙනු ලැබීය.

# තාරකා විද්‍යාවේ නව සොයාගැනීම්

### 2012 TC4 ග්‍රාහකය අපේ පෘථිවිය අසලින් ගමන් කළ බව ඔබ දන්නවා ද?

2017 වසරේ ඔක්තෝබර් මස 12 වැනි දින 2012 TC4 නම් වූ ග්‍රාහකය පෘථිවියට කි.මී. 50,180ක් ආසන්නයෙන් දකුණු පැසිපික් මුහුදු තීරයට ඉහළින් ගමන් කරන්නට විය. පෘථිවියේ සිට චන්ද්‍රයාට ඇති දුර. කි.මී. 384,400 පමණ වන බව ඔබ දන්නවා ඇත. එසේ නම් චන්ද්‍රයාටත් වඩා පෘථිවියට ඉතා ආසන්නයෙන් මේ ග්‍රාහකය ගමන් කර ඇති බව පෙනේ.

මේ ග්‍රාහකය මීටර් 13 ක් පමණ විෂ්කම්භයකින් යුක්ත බව සඳහන් වන අතර, මෙය මුලින් ම සොයා ගන්නා ලද්දේ 2012 ඔක්තෝබර් මස 12 දින PanSTARRS 1 නම් දුරේක්ෂය මඟිනි.

### 2017 භෞතික විද්‍යා නොබෙල් ත්‍යාගය ගුරුත්ව තරංග සඳහා




අමෙරිකානු ජාතික භෞතික විද්‍යාඥයන්



ශ්‍රේෂ්ඨ විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින්




තිදෙනකු ගුරුත්ව තරංග සොයා ගැනීම් සම්බන්ධව 2017 නොබෙල් ත්‍යාගය හිමිකරගෙන ඇත. මේ ගුරුත්ව තරංග පිළිබඳව වසර 100කට පමණ ඉහත මුලින්ම අනාවැකි පළ කරන ලද්දේ ඇල්බට් අයින්ස්ටයින් මහතාය. එය ඔහු ඉදිරිපත් කරන ලද්දේ සාපේක්ෂතාවාදය ඇසුරිනි. අද ඔහු ජීවත්ව සිටියා නම් මේ යුගය ඔහුගේ ජීවිතයේ අමරණීය ම කාලයක් වනවාට කිසිදු සැකයක් නැත. මෙවර මේ සම්මානය දිනාගෙන ඇත්තේ රේනියර් වෙයිස් (Ranier Weiss), කිප් එස් තෝර්න් (Kip SThorn) සහ බැරි සී බැරිෂ් (Bary Barish) යන භෞතික විද්‍යාඥයන් තිදෙනා ය.

### කිසිදු සැඟවිය නොහැකි Planet 9

2016 ජනවාරි මස තාරකා විද්‍යාඥයන් වන මයික් බ්‍රවුන් (Mike Brown) සහ කොන්ස්ටන්ටින් බැටිජින් (Konstantin Batygin) විසින් අපගේ සෞරග්‍රහ මණ්ඩලයට අයත් තවත් ග්‍රහලෝකයක් පවතින බවට සාක්ෂි ඇති බව, ප්‍රකාශයට පත් කර තිබුණි. එය "Planet 09" හෙවත් "9 වැනි ග්‍රහ ලොව" ලෙස හඳුන්වන ලදී. මෙය සූර්යයාට බොහෝ ඈතින් එනම්, කුපර් පටියේ ඇති ග්‍රහලෝකයක් බවට විශ්වාස කෙරිණි.

මයික් බ්‍රවුන් සහ කොන්ස්ටන්ටින් බැටිජින් විසින් සිදු කරන ලද නවතම අධ්‍යයනයන්ට අනුව "Planet 09" අනිවාර්යයෙන් ම පවතින බවත්, මෙය අපගේ සෞරග්‍රහ මණ්ඩලයට ඇතුළත් විය යුතු බවත් තහවුරු කර ඇත. Planet 09 සංඛ්‍යාත්මක ගණනය කිරීම් මඟින් සොයා ගත් ග්‍රහලෝකයකි. සූර්යයා ගේ සිට පෘථිවියට ඇති දුර මෙන් 1500 ගුණයක පමණ දුරකින් මෙය පිහිටා ඇත. එහි ස්කන්ධය පෘථිවියේ මෙන් 10 ගුණයක් වන අතර, විශ්කම්භය පෘථිවියේ මෙන් දෙගුණයේ සිට සිව් ගුණයක ප්‍රමාණයක් වේ. මෙහි කක්ෂය බොහෝ ඉලිප්සීය හැඩයක් ගන්නා අතර, පරිභ්‍රමණ කාලය වර්ෂ 15,000ක් පමණ වේ. එනම් Planet 09 හි එක් වර්ෂයක් අපේ වර්ෂ 15"000කි. මෙය සොයා ගැනිමට නිරීක්ෂණාත්මක සාක්ෂි 5ක් ඉවහල් වී ඇති අතර Planet 09 පවතින බව විශ්වාස නොකරන්නේ නම් පිළිතුරු නැති ගැටලු 5ක් ඉතිරි වන බව කොන්ස්ටන්ටින් බැටිජින් පවසයි. තාරකා විද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන ඔබට Planet 09 පිළිබඳ තවත් බොහෝ තොරතුරු නොබෝ කලකින් ම දැනගත හැකිවනු ඇත.











# BIMSTEC විශේෂඥ කණ්ඩායම් රැස්වීම සාර්ථකයි

Bay of Bengal Initiative for Multi Sectoral Technical and Economic Co- orperation (BIMSTEC)තාක්ෂණ සම්ප්‍රේෂණ පහසුකම් පිහිටුවීමේ, හතර වැනි විශේෂඥ කණ්ඩායම් රැස්වීම පසුගිය 21-22 දෙදින කොළඹ දී සාර්ථකව අවසන් විය. මේ රැස්වීම සඳහා බංගලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන BIMSTEC සාමාජික රටවල්වලින්, සාමාජිකයන් 08 දෙනෙක් සහභාගී වූහ. විද්‍යා, තාක්ෂණය හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් මේ රැස්වීම ආරම්භ කරන ලද අතර මේ රැස්වීම ශ්‍රී ලංකා නියෝජිත ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසමේ, සභාපති මහාචාර්ය ජයන්ත විජේරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. BIMSTEC මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක එස්.එම්. නස්මුල් හසන් මහතා ද මේ සඳහා සහභාගී වූ අතර, විචාරණවලින් අනතුරුව තාක්ෂණ පහසුකම් (Technology Trancer Facility - TTF) සම්බන්ධව එකඟතාවයකට එළැඹිණි.

විදසා
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නිල පුවත්පත

උපදේශකත්වය
උදය ආර්. සෙනෙවිරත්න
ලේකම්
(විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය)
ජේ. එම්. මංගලතිස්ස
රාජ්‍ය ලේකම්
(විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය)
එච්. එම්. බී. සී. හේරත්
අතිරේක ලේකම්
(තාක්ෂණ හා පර්යේෂණ සංවර්ධන)
නන්දනී සමරවික්‍රම
අතිරේක ලේකම් - (පාලන හා මූල්‍ය)

මෙහෙයවීම
පී. එම්. ධර්මතිලක
අධ්‍යක්ෂ - (විද්‍යා හා පර්යේෂණ සංවර්ධන)
හිමාලි ඩබ්. කේ. අතාවුදගේ
අධ්‍යක්ෂ - (තාක්ෂණ හා අන්තර්ජාතික සබඳතා)
නසීමා අහමඩ් - අධ්‍යක්ෂ (සැලසුම්)
නිමාලි කුලතුංග - අධ්‍යක්ෂ (සැලසුම්)
කේ. අරුණු ප්‍රභා පෙරේරා - අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය)
ඒ. කේ. පී. පීරිස් - ප්‍රධාන ගණකාධිකාරී
එම්. සී. ගමගේ
ප්‍රධාන අභ්‍යන්තර විගණක

සම සංස්කරණය
මහේෂ් සමරසේකර - මාධ්‍ය ලේකම්
0112 - 372288
ධම්මිකා රත්නායක
මධුකා සුභාෂිණී
එල්. ඩී. අයි. යූ. කුමාර
(විද්‍යා හා පර්යේෂණ සංවර්ධන අංශය)

නිල ඡායාරූප
දුලිප් නයනප්‍රිය
අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය

LAKE HOUSE
Government Relations Dept.
සම්බන්ධීකරණය / සැලසුම් හා නිර්මාණ අධීක්ෂණය
සමන්ත කරුණාසේකර
කළමනාකරණ කර්තෘ - රාජ්‍ය සබඳතා
0112 429297 / 077 3493785
සම්බන්ධීකරණ කර්තෘ
ප්‍රමිතා රන්දලී පබසරා
සහාය සංස්කරණය
ඩබ්. ඒ. එස්. නිසංසලා කුමාරි
නිර්මාණ ශිල්පී
ධනුෂ්ක බණ්ඩාර/ අශානි ජයවර්ධන
ඩිජිටල් ඡායාරූප සැකසුම - නිෂ්පාදන ග්‍රැෆික් අංශය
මුද්‍රණය - ලේක්හවුස් රොටරි මුද්‍රණ අංශය






# ලෝක විද්‍යා දිනයට සමගාමී
# 'ජාතික විද්‍යා දිනය සහ ජාතික විද්‍යා සතිය'






'ගෝලීය අවබෝධය උදෙසා විද්‍යාව' තේමාව යටතේ නොවැම්බර් 10 වැනි දින ජාතික විද්‍යා දිනය, ලෙසත්, නොවැම්බර් 10–17 දක්වා සතිය 'ජාතික විද්‍යා සතිය' ලෙසත් නම් කෙරිණි. 'ජාතික විද්‍යා දිනය' සහ 'ජාතික විද්‍යා සතිය' විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මඟින්, විද්‍යාව හා තාක්ෂණවේදයේ යෙදවුම්වල ඇති ප්‍රායෝගික හා ඵලදායී භාවිතයන් පිළිබඳව දිවයින පුරා ජනතාව දැනුවත් කිරීමට විවිධ වූ වැඩසටහන් රැසක් පැවැත්වීමට පියවර ගන්නා ලදී.

**ලෝක විද්‍යා දින වැඩසටහන්**

- ඩී.එස්. සේනානායක විද්‍යාලය – කොළඹ
- ජාතික මූලික අධ්‍යයන ආයතනය
- 'විද්‍යා පාගමන' – 2017
- විද්‍යා සිනමා උලෙළ – පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් සහ මහජනතාව ඇතුළු 100,000ට අධික ප්‍රේක්ෂක පිරිසක් සහභාගී වූහ.

**ඡායාරූප - මාධ්‍ය ඒකකය**
**විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය**
**ගයාන් පුෂ්පික**





















වෂී 2017 ක් වූ නොවැම්බර් මස 29 වැනිද බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.